# නාථ දේව වන්දනයේ සමාජ විද්‍යාත්මක පසුබිම

අජිත් තල්වත්ත

## හැඳින්වීම

ලාංකික ජන සමාජයෙහි වන්දනයට පත් වන දෙවිවරුන් රැසකි. ඔවුන් අතර බෞද්ධ සමාජයේ ගෞරවාදරයට පත් දෙවි කෙනකු ලෙස නාථ දෙවියන් වඩාත් වැදගත් වේ. උන් වහන්සේ මෙරට ඉතිහාසයේ වඩාත්, වැදගත් වන්නේ බෝධිසත්ව තත්වයේ සිට ක්‍රමික ව දේවත්වයට පත් වීමත් නිසා ය. ජන හදවත්වල අවලෝකිතේශ්වර නාථ බෝධිසත්වයන් ලෙස පුද පූජා ලැබූ, උන් වහන්සේ කාලානුරූප ව බෝධිසත්ව තත්වයෙන් මිදී දේවත්වය ආරෝපණය කරගන්නා ලදි. මෙතැන් පටන් අවලෝකිතේශ්වර නාථ ලංකාවේ හඳුන්වන ලද්දේ ඔහුගේ තවත් අභිධානයක් වන ලෝකේශ්වර නාථ යන්නෙහි කෙටි නම වන නාථ නමිනි. බෝධිසත්වයන්ගේ මූලාරම්භය මුළුමනින් ම යටපත් වී, ඔහු උඩරට රාජධානියේ දේශපාලන උරුමය තහවුරුවීමට සම්බන්ධ ලෞකිකත්වයට නැඹුරු බලවත් ජාතික දෙවියකු බවට පත් විය. ජන සමාජයේ ගෞරවයට ලක් වූ මෙම දෙවියන්ට සමාජීය වශයෙන් විශේෂ වැදගත්කමක් ලැබී ඇත. මෙ මගින් සාකච්ඡා මගින් නාථ දෙවියන් හඳුනාගෙන, උන් වහන්සේට වන්දනාමාන කිරීමේ සමාජ විද්‍යාත්මක වැදගත්කම අධ්‍යයනය කිරීමට අපෙක්ෂිත ය.

## සාකච්ඡාව

රජරට ශිෂ්ටාචාරය බිඳවැටීම හා දාසයවන සියවසේ අග කුමන්ත්‍රණ ජාලයකින් පසු පිහිටුවා ගනු ලැබූ උඩරට රාජධානිය බිහිවීම අතරතුර මෙ රට දේශපාලනය ක්‍රියාවලිය ගැටලු සහිත කාල පරිඡේදයකි. ක්‍රි.ව.7-9 සියවස්වල ව්‍යාප්ත ව සහ ස්ථාවර ව පැවති, අවලෝකිතේශ්වර බෝධිසත්වයෝ ලෙස මෙතෙක් සිදු වූ ව්‍යවහාරය වෙනුවට නාථ දෙවිඳුන් ලෙස යොදාගත් මුල් ම අවස්ථාව වන්නේ දඹදෙණි යුගයේ දී ය **(ලියනගේ 2006:164)**. දෙවන පැරකුම් රජ දවස **(ක්‍රි.ව.1236-1270)** ලක්දිව මහා දුර්භික්ෂයක් ඇති වූ විට රජතුමා වර්ෂාව ප්‍රාර්ථනා කළ බව **මහාවංසයේ** සඳහන් වේ **(ඌන පූරණ සහිතො මහාවංසය 1929: 87,3-9)**. තව ද වංසකතාවේ ප්‍රථමවරට නාථ-මෛත්‍රී දේවාදීන් පිදිය යුතු දෙවියන් ලෙස සඳහන් වන්නේ ද  මෙම රාජ්‍ය සමයේ දී ය."තුනුරුවන් චෛත්‍ය බෝධීන්ට ද මහාර්ධි ඇති නාථ මෛත්‍රෙය දේවාදි පිදිය යුතු දෙවියන්ට ද නන් වැදෑරුම් පූජා පවත්වා පිරිත් කියවා දළදා වහන්සේ නුවර පැදකුණු කරවා වර්ෂාව ප්‍රාර්ථනා කළ කල්හි"..... (එම)තව ද **පූජාවලිය (පූජාවලිය1986:234)** සහ

**සද්ධර්මාලංකාරය (සද්ධර්මාලංකාරය**1953:214 සහ 586)යන කෘතිවල ද මෛත්‍රෙය බෝධිසත්වයන් ගැන විවරණ සහිත ව සඳහන් වේ. දඹදෙණි යුගයේ දෙවන පැරකුම් රජුට බුදු බව ප්‍රාර්ථනා කරවීමට දේවපතිරාජ අගමැතිවරයාගේ ආරාධනාවෙන් බුද්ධපුත්‍ර හිමියෝ **පූජාවලිය** රචනා කළහ (**පූජාවලිය**1986:698).මෙම රජතුමාගේ සහෝදරයා වූ විජයබාහු, බෝසත් විජයබාහු ලෙස හඳුන්වා තිබේ. මෙම තොරතුරු අනුව පැහැදිලි වන්නේ මෙම යුගයේ නාථ සහ මෛත්‍රෙය ඇදහීම ව්‍යාප්ත ව පැවති බව යි.

අනුරාධපුර යුගයේ පටන් ප්‍රකට ව පැවති බෝධිසත්ව වන්දනය හා බුද්ධත්වය ප්‍රාර්ථනා කිරීම ක්‍රියාවලිය ගම්පොළ යුගයේ දී ද පැවති බවට එම යුගයට අයත් ශිලා ලේඛන සහ සාහිත්‍ය මූලාශ්‍රය සාක්ෂ්‍ය දරයි. මෙම යුගයේ විහාරස්ථාන ඉදිකිරීමේ දී දේව රූප සමග ම බෝධිසත්ව රූප ද කරවා ඇත. **ජාතක පොතේ** ඇති කථා ගම්පොළ යුගයේ විහාරස්ථානවල සිතුවම් කරන ලදි (**EZ 1948( IV, 90 -110).** ගඩලාදෙණි ලිපියේ නාථ සහ මෛත්‍රෙය බෝධිසත්වයන් දෙදෙනා දෙවියන් ලෙස හඳුන්වා ඇත. "..පල්ලේ මාලේ ශක්‍ර, බ්‍රහ්ම, සුයාම යන නාථ, මෛත්‍රෙ ආදී දෙවියන් දෙවියන් විසින් පිරිවරන ලද..." (**Nandesena1976:137)** යනාදී ලෙස දෙදෙනා ගැන දැක් වේ. ලංකාතිලක සෙල්ලිපියේ බුදු රජාණන් වහන්සේ ළඟට වැදගත් කොට සැලකී ඇත්තේ මෛත්‍රෙ බෝධිසත්වයන් වහන්සේ සහ ලෝකේශ්වර නාථයන් වහන්සේ ය. "..තවද සුයාම, සන්තුෂිත, ශක්‍ර, බ්‍රහ්ම, විෂ්ණු මහෙශ්වරාදී වූ දිව්‍ය රූපත් මෙකී හැමදෙනාගේ දිව්‍ය ස්ත්‍රී රූපත් ලංකාවට අරක් ගත් කිහිරැළි උපුල්වන් දෙව් රජ්ජුරුවන් වහන්සේත් සුමන, විභීෂණ, ගණපති, කන්ද කුමාරාදී..." (**Paranavitana 1966;05)** යනුවෙන් සඳහන් වේ.

ඉහත තොරතුරු අනුව අවබෝධ වන්නේ හත්වන සියවසේ පමණ සිට ගෞරයට පත් වූ අවලෝකිතේශ්වර බෝධිසත්වයන් 14 වන සියවස වන විට ලෝකේශ්වර නාථ හෝ නාථ යන නමින් දේවත්වයට පත් වී සිටින බව ය. ලෝකේශ්වර නාථ සම්බන්ධයෙන් මහාචාර්ය සෙනරත් පරණවිතාන දක්වන අදහස ද වැදගත් වේ. "ස්වාමි" යන අර්ථය ගන්නා නාථ යනු ලෝකේශ්වර නාථ යන සම්පූර්ණ නාමයේ කොටසක් පමණි. ලෝකේශ්වර යන නම අවලෝකිතේශ්වර යන්නේ නම් රාශියක් එක් ව ඇත **(Paranavitana1962:53)**. නාථ යනු එම දෙවියන්ගේ දකුණු ඉන්දියානු නාමය බවට මහාචාර්ය මංගල ඉලංගසිංහ විසින් පෙන්වාදී ඇත (**ඉලංගසිංහ** 2005:270-280). එ මෙන් ම මෙම කාල පරිච්ඡේදයේ දී නාථ සහ මෛත්‍රෙය දෙදෙනෙකු ලෙස ද වෙන් වන් වශයෙන් හඳුනාගත් බව පෙනේ.

මෙම යුගය වන විට සමාජයේ ගෞරවාදරයට පාත්‍ර වූ සිවුවරම් දෙවිවරුන් පිළිබඳ තොරතුරු ද හමු වේ. ඒ අනුව අනුරාධපුර අවධියේ සිට භාවිතයේ පැවති ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ සහ වෛශ්‍රවණ දෙවිවරු භාවිතයෙන් ඉවත් ව ගොස් ඇත. සිවු වන බුවනෙකබාහු රාජ්‍ය සමයට අයත් අලවල අමුණ සෙල්ලිපියේ.. "බ්‍රහ්ම, විෂ්ණු, මහේශ්වර සතරවරම් කිහිරැළ උපුල්වන්, සමන්, විභීෂණ, ගණපති, කන්ද කුමාර"... (**Paranavitana1966 (38-45**) යන දෙවිවරුන් ගැන සඳහන් වේ.

මෙම දෙවිවරුන් ලෝකපාල දෙවියන් ලෙස හඳුන්වා තිබේ **(අබයරත්න2006:22)**. සාමාන්‍යයෙන් සතරවරම්, කිහිරැළි උපුල්වන්, සමන්, විභීෂණ වැනි දෙවිවරුන් බෞද්ධ සාහිත්‍යයේ නිරතුරු ව වේ. මෙ මගින් එවකට පැවති ආගමික සම්මිශ්‍රණය මැනවින් ප්‍රකට ය. මෙම ලිපියේ එන පාඨය ලංකාතිලක විහාරයේ කරවා තිබූ දේව රූප ගැන විස්තරයට සමාන ය. මෙහි සතරවරම් දෙවිවරුන්ගේ ගණයට දෙවිවරුන් පස්දෙනෙකු ඇතුළත් වීම ලංකාතිලක විහාර ලිපියෙන් ද තහවුරු වේ **(Paranavitana1966:42-45)**. එම සෙල්ලිපියේ ද මෙම දෙවිවරුන් පස්දෙනා වෙන වෙන ම කණ්ඩායමක් ලෙස දක්වා තිබේ. මෙම විහාරයේ සතර දිසා මුඛ ව විභීෂණ (දකුණ), බටහිර (උපුල්වන්) සමන් (උතුර) යොදා ගත්ත ද නැගනහිර දිශාවට යෙදීමට නො හැකි වන්නේ ප්‍රවේශ දොරටුව නිසා ය. එ බැවින් නැගෙනහිර දිශාව අභිමුඛ ව ස්කන්ද සහ ගණේශ රූප නිමවා ඇත. එ මගින් තහවුරු වන්නේ සතරවරම් දෙවිවරුන් පිළිබඳ පැවති විවිධත්වය යි. නමුත් ආචාර්ය ජෝන් හෝල්ට් පවසන්නේ ලංකාතිලක විහාරයේ හින්දු දේව සංකල්පයට අයත් දෙවිවරුන් සහ බෝධිසත්වවරුන් නිරූපණය කිරීමෙන් බුදුන් හා දෙවියන් අතර මෙන් ම එවක ආරම්භ වූ ආගමික සංකල්ප අතර ද පැවති සමීපතාව දැක්වීම බව යි **(හෝල්ට්1994:145)**. තව දුරටත් ඔහු පවසන්නේ බුදුන් වටා බ්‍රාහ්මණික සහ මහායාන දෙවිවරුන් ස්ථාපිත කිරීමෙන් රජු වටා සිටි හින්දු පිරිස් යටත් වැසියන් බව දැක්වීමට දරන උත්සාහයක් බව යි **(එම)**. සතරවරම් දෙවිවරුන් කවුරුන් ද නිශ්චිත ව හඳුගැනීමට **නිකාය සංග්‍රහය** ද උපකාර වේ. මෙහි ජයවර්ධනපුර බලකොටුව තනවා එහි පවුර මුදුනේ සතරවරම් දෙවිවරුන්ට දේවාලය ඉදිකර ඇත. එම දෙවිවරුන් ලෙස කිහිරැළි උපුල්වන්, සමන් බොක්සැල්, විභීෂණ සහ ස්කන්ද කුමාර යන නම් දක්වා තිබේ **(නිකාය සංග්‍රහය1907:84)**. මේ අනුව ගම්පොළ සහ කෝට්ටේ යුග වන විට සතරවරම් දෙවිඳුන් ලෙස නිශ්චිත ව උපුල්වන්, සමන්, විභීෂණ සහ ස්කන්ද යන දෙවිවරු හඳුනාගෙන තිබුණි. මෙහි දී දක්නට ලැබෙන විශේෂත්වය වන්නේ මෙම කාලපරිච්ඡේදයේ දී නාථ දෙවියන් සිවුවරම් දේව මණ්ඩලයට අයත් නො වීම යි. උපුල්වන් දෙවියන් මගින් නාථ දෙවියන් නිරූපණය වූවා ද යන්න තහවුරු කර ගැනීමට අවධානය යොමු කළත් ප්‍රමාණාත්මක සාක්ෂ්‍ය හමු නො වේ.

මහනුවර යුගයේ දී සතරවරම් දේව පද්ධතියට විෂ්ණු ඇතුළත් ව ඇත. ඒ වන විට උපුල්වන් හා විෂ්ණු යන දෙවිවරුන් එක ම දේව ඇදහිල්ලක් වශයෙන් පිළිගැනිණ. උපුල්වන් දෙවියන් එතැන් පටන් දකුණු ලක්දිවට අධිපති දෙවියා වශයෙන් ද පිළිගත් බව මහාචාර්ය පුංචි බණ්ඩාර සන්නස්ගල සඳහන් කරයි **(සන්නස්ගල1973:257)**. එහෙත් දක්නට ඇති විශේෂත්වය වන්නේ මහනුවර රාජධානි අවධියේ දී සිවු දේවාලයන්ට අධිපති සිවු දෙවියන් ලෙස නාථ, විෂ්ණු, කතරගම සහ පත්තිනි යන දෙවිවරුන් හඳුනා ගැනීමට පුළුවන **(අභයසිංහ1952:83)**.මෙහි දී පෙන්වාදිය යුතු වැදගත් කරුණක් වන්නේ මහනුවර යුගයට පෙර සිවු දෙවිවරුන් හෝ සිවු දේවාලය පිළිබඳ තොරතුරු හමු නො වීම යි. මන්දාරම්පුර පුවතට **(මන්දාරම්පුර පුවත1958:කවි 750)** අනුව සිවු දේවාලය සංකල්පය පිළිබඳ තොරතුරු හමුවන්නේ 18 වන සියවසෙන් පසු ව ය.

මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ නාථ දෙවියන් සිවුවරම් දේව මණ්ඩලයට ඇතුළත් නො වුණ ද එවකට පුද පූජා ලබන දේව මණ්ඩලයේ ඉදිරියෙන් ම සිටි බව යි. නාථ දෙවියන් දෙවිවරුන් අතර ප්‍රමුඛත්වයට පත්වීමෙන් රාජ්‍යත්වය සහ ඔහු අතර පැවති සම්බන්ධතාව දැකගත හැකිවන්නේ සගම ලිපියෙන් **(Z1948:VI,296-311)** අලකේශ්වර විසින් යාපනයේ ආචාර්ය චක්‍රවර්තිගේ සේනා මාතලේ අසල දී පරාජයට පත් කරන ලද බව මෙම ලිපියේ සඳහන් වේ. එහි දැක්වෙන තොරතුරුවලට අනුව උඩරට සිංහල පාලනය සහ නාථ සම්බන්ධ වූ අකාරය මුල් වරට දක්වා අත. ඒ සමඟ ම සිංහල දේශපාලනයට නාථ දෙවියන් ඍජු ව ම සම්බන්ධ වීම පමණක් නො ව, සිංහල රජවරුන්ගේ ජයග්‍රහණය හා ඓශ්චර්ය වැඩි කිරීම සඳහා මඟ පෙන්වන ආරක්ෂකයා වශයෙන් ඔහු මෙම සෙල්ලිපියේ හඳුන්වා ඇත. නාථ බෝධිසත්වයකුට වඩා ලංකාරක්ෂක දෙවියකු ලෙස ක්‍රියාත්මක වූ බව පෙනේ. නාථ දෙවියන් සම්බන්ධයෙන් ආචාර්ය ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට් දක්වන අදහස ඉතා වැදගත් වේ. "..අවලෝකිතේශ්වර මහායාන සම්බන්ධය අමතක වී ගිය අතර ඔහු ලෞකික වර ලබා දෙන, ආරක්ෂක ප්‍රාදේශීය දෙවියෙකි. ඒ සමඟ ම ඔහුගේ නම ද නාථ වශයෙන් කෙටි කරනු ලැබූවේ ඉන් ආරක්ෂකයා යන අදහස දෙන බැවිනි. තවද උන් වහන්සේ බෝධිසත්ව, දේව සහ රජ සංකල්ප මිශ්‍ර රාජත්වය පිළිබඳ අදහස නිසා ද රජවාසලට සම්බන්ධ දෙවියෙක් වූ බව යි. මෙම අදහස දාහතර වන සියවසේ නාථ සංකල්පය ගොඩනැඟීමට උපකාර විය **(හෝල්ට්1994: 150)...**" එසේ ම අම්පිටිය ලිපියේ (**EZ1948: IV, 271-273)** දැක්වෙන "සෙංකඩගල දෙවියන්" යනු ද මෙම නාථ දෙවියන් ම බව ඔහුගේ අදහස යි. මේ වන විට නාථ කෘත්‍යමය වශයෙන් දෙවියකු බවට පත් සිටි බව ද, සත්වයන් සසරින් එතර කිරීමේ බෝධිසත්ව ගුණය වෙනුවට බැතිමතුන් ආරක්ෂා කරන ලෞකික කාර්යන් ඉටු කළ දෙවියකු බවට පත් වූ බව ද ආචාර්ය ජෝන් හෝල්ට් වැඩිදුරටත් පෙන්වා දේ **(හෝල්ට්1994:150).**

**තිසර සන්දේශයේ (තිසර සංදේශය1936:කවි,**130-131) ද නාථ දෙවියන් "නතිඳු" නමින් ද එතුමන්ගේ දේවිය තාරා බිසව නමින් ද වර්ණිත ය. එහි දී දොරවක තිබූ නාථ දේවාලයත් නාථ දෙවිඳුන් හා තාරා බිසවත් නමදින ලෙස තිසරාට විධාන කර තිබේ. ආචාර්ය ජෝන් හෝල්ට් පවසන්නේ බුදු මැඳුර තුළ නාථ දේව ප්‍රතිමාවක් පැවති බවකි **(හෝල්ට්1994:152).** මෙසේ නාථ බෝධිසත්වවරයකු ලෙස ප්‍රකට නිසා එසේ තබන්නට ඇත. බුදු බව ප්‍රාර්ථනා කිරීම ද මෙ කල බහුල ව සිදු වූ බව ඉහත තොරතුරු මගින් අනාවරණය වේ. කෙසේ නමුත් මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ ගම්පොළ යුගයේ පැවතියේ මහායාන හා හින්දු දේව විශ්වාස සම්මිශ්‍රණය වූ ආගමික පසුබිමක් පැවති බව යි.

ගම්පොළ යුගයේ දී නාථ දේව වන්දනය ජනප්‍රිය වී වැදගත්කමින් වැඩිවන අයුරු පෙනේ. එසේ වීමට කුමන හේතු ඉවහල් වූවා ද යන්න පිරික්සිය යුතු ය. දිගු කාලීන වශයෙන් දේශපාලන ක්ෂේත්‍රයේ ස්ථාවරත්වයක් නොමැති වූ විට සිදුවන රට තුළ ව්‍යාකූල පසුබිමක් ඇති විය. ගම්පොළ යුගයේ දී මෙම තත්වය වඩාත් හොඳින් නිරූපණය වන අතර ඇතැම් විට විදේශීය රාජ්‍යයන් සමඟ ද

සබඳතා වැඩිකර ගැනීමට උත්සාහ ගනී. විශේෂයෙන් ම ධර්මකීර්ති මාහිමියන් සහ සේනාලංකාධිකාරයන් දකුණු ඉන්දියාවේ ආගමික කටයුතුවල නිරත වීමත්, **(පියනන්ද1993:3-4)** ඒ සම්බන්ධතා මත දකුණු ඉන්දියානු ශිල්පීන් මෙ රට විහාර කර්මාන්ත සඳහා ගෙන්වා ගැනීමත්, **(හෙට්ටිආරච්චි1972:737-739)** මේ සම්බන්ධතාවලට ප්‍රකට නිදසුන් ය. දේව විශ්වාසය හා හින්දු ආගමික බලපෑම් මෙ රට සංස්කෘතියට සහ බුදු දහමට තර්ජනාත්මක තත්වයකට පත් නො වී, සහජීවන තත්වය නිතර පැවති බවත් ආගමික සම්මිශ්‍රණයක් ඇති කිරීමට දායක වූ බවත් පෙනේ. මෙම යුගයේ දී නාථ බෝධිසත්වයෙකුට වඩා දෙවියෙකු ලෙස සමාජය පිළිගත්තේ ය.

අධික භක්තිය හා ගෞරවය නිසා ම සිංහල බෞද්ධ ජනතාවගේ පිදුමට ලක් වූ හෙතෙම, 14 වන සියවස වන විට ලෝකේශ්වර නාථ යන නමින් දේවත්වයට පත් වී සිටි බව අවබෝධ වේ. මහාචාර්ය සෙනරත් පරණවිතාන නාථ දෙවියන් ලෙස හඳුන්වන්නේ අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ එක් වේශයක් වන රෝග සුව කරන දෙවියෙකු වශයෙනි **(පරණවිතාන1962:193)**. විල්හෙල්ම් ගයගර් පඬිතුමා **(ගයිගර්1969:248)**, සිරි තිලකසිරි **(තිලකසිරි2008: 170)** සහ කහටපිටියේ ධීරානන්ද **(ධීරානන්ද1965:121)** යන උගතුන් වැනි උගතුන් පෙන්වා දෙන්නේ නාථ දෙවියන් යනු අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ම බව යි. මහාචාර්ය චන්දන අබයරත්තන පවසන්නේ නාථ දෙවියන්, ලෝකේශ්වර නාථ හා සෙංකඩගල නාථ ස්වාමීන් වශයෙන් හැඳින්වූ බව යි **(අබයරත්න2006:202)**. මෙම විද්වතුන් නාථ දෙවියන් පිළිබඳ දිරිපත් කර ඇති මත සමස්තයක් ලෙස ගෙන පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ අවලෝකිතේශ්වර බෝධිසත්වයන් නාථ දෙවියන් වූ බව යි. ගම්පොළ යුගයේ දැදිගම රජ කළ පස්වන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ ලියවුණු තිසර සංදේශයේ නාථ දෙවියන් නතිඳුන් නමින් ද එතුමාගේ දේවිය තාර බිසව යනුවෙන් ද **(තිසර සංදේශය,කවි126)** වර්ණනාවට බඳුන් ව ඇත. තව ද එහි දසපද සැහැල්ලේ දී "නතිඳුන් වැඳ තොසිනි ඔහු අයදු කුලුණු දෙන ලෙස මනදොළේ" යැයි ද **(එම,127)** ලෙසට 127 වන කවියෙන් "ලක් මැඳුර......දුසිරි තෝරා හැර සුපිරිගුණයෙන් අලංකාර කළ තාරා බිසව නමදින" **(එම,130)** ලෙස තිසරාට පවසා ඇත.

නාථ දේව සංකල්පයේ ඓතිහාසික විකාශය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී කෝට්ටේ යුගය ද වැදගත් වේ. හයවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ දී නාථ දේව වන්දනය සමාජගත වීම පමණක් නො ව බෙහෙවින් බලසම්පන්න වීම ද සිදු විය. මේ සඳහා මහායාන බෞද්ධ සංකල්පය, රාජ්‍යත්වය පිළිබඳ සංකල්පය, හින්දු පූජා විධි සහ ශාන්තිකර්ම යනාදිය සංස්කෘතිකමය වශයෙන් සංකලනය වීම යන හේතු බලපාන ලදි. හය වන පරාක්‍රමබාහු රජතුමා ස්වකීය මෑණියන් සිහිකිරීම පිණිස පැපිලියාන විහාරයේ පිහිටුවා ඇති ශිලාලේඛනයේ ද "නාථ-මෛත්‍රිය දෙතැන" **(ජයතිලක1963:41)**. යනුවෙන් සඳහන් වේ. නාථ දෙවිඳුන් සම්බන්ධ දැඩි භක්තිවන්තයකු වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි නාථ දෙවිඳුන් පිළිබඳ විස්තර කරන්නේ සූර්යයාට හා චන්ද්‍රයාට සමාන කළ හැකි ලෙසිනි. ඉහත ලිපියට අනුව නාථ-මෛත්‍රි

ගැන සඳහන් වුවත් තොරතුරු බහුල ව ලැබෙන්නේ නාථ දෙවියන් සම්බන්ධයෙනි. තොටගමුවේ ශ්‍රී රාහුල තෙරුන්ගේ දීප්තිමත් ශිෂ්‍යයකු වූ ශ්‍රී රාමචන්ද්‍ර කවි භාරතී නම් වංග බ්‍රාහ්මණයා විසින් **වෘත්තරත්නාකාර** නම් ඡන්දස් ග්‍රන්ථයට පඤ්චිකාවක් ලියන ලදි (Silaskandha1926:96). මෙහි අන්තර්ගත ශ්ලෝක හතරක අවලෝකිතේශ්වර පිළිබඳ සඳහන් වේ. තොටගමුවේ රාහුල හිමියන් විසූ විජයබා පිරිවෙණට සම්බන්ධ නාථ දෙවිඳුන් සිය බෝධිසත්වභාවය පවත්වා ගෙන සිටි අයුරු විස්තර වන බව මහාචාර්ය සෙනරත් පරණවිතාන පවසයි (Paranavitana1951:15-18). ආචාර්ය ජෝන් හෝල්ට් මෙම ශ්ලෝක වැදගත් වන්නේ ඒවා සම්බන්ධ ස්ථානය සහ කාලය නිසා පමණක් නො ව ඒවා පැහැදිලි ව ම මහායාන අදහස් ගැබ් වූ බෝධිසත්වයන් පිළිබඳ කරුණු ඇතුළත් වන නිසා බව පවසයි **(හෝල්ට්1994:61)**. ඉහත කරුණුවලින් අනාවරණය වන්නේ මෙම යුගය වන විට ද නාථ සහ මෛත්‍රෙ වන්දනය පැවතුණත් නාථ දෙවියන් වඩාත් ජනප්‍රිය දෙවියන් වූ බව යි.

කෝට්ටේ යුගයෙන් පසු නැවත නාථ දෙවියන්ගේ සම්බන්ධකම් ප්‍රකට වන්නේ මහනුවර යුගයේ දී ය. පළමු වන විමලධර්මසූරියගේ (ක්‍රි.ව.1591-1604) රාජ්‍ය කාලයේ සිට නරේන්ද්‍රසිංහ රජුගේ (ක්‍රි. ව. 1707-1739) රාජ්‍ය කාලය අවසානය තෙක් නාථ දේව වන්දනය යම් පසුබෑමකට ලක් විය. එහෙත් නාථ දෙවියන් පසු කාලීන ව සිංහල රාජත්වය හා සමීප සම්බන්ධතාවක් ඇති කර ගත් බව හෙළි වේ. විශේෂයෙන් ම මෙම පසුබිම නායක්කාර්වරුන් බලයට පත්වීමෙන් පසු ප්‍රබල වේ. මෙම කාල පරිච්ඡේදයේ දී නැවත වරක් නාථ දෙවියන් සහ මෛත්‍රීය බෝධිසත්වයන් පිළිබඳ සඳහන් වේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1747-1782) රිදී විහාරයේ නාථ දෙවියන්ගේ ප්‍රතිමාවක් සහ මෛත්‍රීය බෝධිසත්වයන්ගේ ප්‍රතිමා දෙකක් කර වූ බව මහාවංශයේ සඳහන් වේ **(මහාවංසය, 252-253)**. අස්ගිරි විහාර පුවරු ලිපියෙහි ද නාථ දෙවියන්ගේ සහ මෛත්‍රීය බෝධිසත්වවරුන් ගැන සඳහන් ව ඇත **(වික්‍රමගමගේ, 2006:18)**. ක්‍රි.ව. 1780 ට අයත් දඹුලු විහාර තුඩපතෙහි දැක්වෙන ආකාරයට දඹුලු විහාරයෙහි මෛත්‍රීය සහ නාථ යන දෙදෙනාගේ ප්‍රතිමා කර වූ බව සඳහන් වේ (Nandasena1976 (67-68). මෙම විහාරයේ හිටි බුද්ධ ප්‍රතිමාවට දකුණු පසින් මෛත්‍රීය බෝධිසත්ව ප්‍රතිමාවත් වම්පසින් නාථ ප්‍රතිමාවත් පිහිටුවා ඇත. ප්‍රධාන බුදුරුව සමඟ මේ දෙදෙනාගේ පිළිම තිබීමෙන් නිරූපණය වන්නේ ධර්මය පිළිබඳ අතීත අවබෝධයත්, වර්තමාන ආරක්ෂාව සහ අනාගත ප්‍රතිමූර්තිය බව ආචාර්ය ජෝන් හෝල්ට් පවසයි **(හෝල්ට්,1994,162)**. සිංහල සිවුවරම් දෙවියන්ගෙන් කෙනෙකු බවට පත් වන නාථ පසු කාලීන ප්‍රධාන සංස්කෘතික මංගල්‍යයන්ට ද එකතු විය **(බෝංගොඩ,256)**. මහනුවර යුගයේ අවසාන භාගයේ දී ප්‍රමුඛ දෙවියා සහ ජනප්‍රිය දෙවියා වන්නේ නාථ දෙවියන් ය. මෙම පසුබිම තුළ උඩරට ප්‍රදේශයේ නාථ දෙවියන් හා බද්ධ වූ සංස්කෘතියක් ඇති වේ. මහනුවර යුගයේ දීත් මෛත්‍රීය බෝධිසත්වයන් පිළිබඳ ව තොරතුරු සඳහන් වුව ද එය ක්‍රමික ව භාවිතයෙන් ඉවතට ගිය බවක් පෙනේ. පසු ව මෙම තත්වය ආරෝපණය වන්නේ නාථ දෙවියන්ට ය. ඒ අනුව නාථ ජන හදවත් තුළ ලැගුම් ගන්නේ අනාගත බුදු වන මෛත්‍රීය බෝසතුන් ලෙස ය.

නාථ දේව වන්දනය ක්‍රමික ව වර්ධනය වූ ආකාරය ඉහත තොරතුරුවලින්

පැහැදිලි වේ. උඩරට ප්‍රදේශයේ ජනප්‍රිය වූ නාථ වන්දනය පසු කාලීන ව එහි පසුබෑමක් සිදු විය. කෙසේ නමුත් නූතන සමාජයේ උන් වහන්සේ දේවියෙකුට වඩා බෝධිසත්වයෙක් ලෙස සමාජ ගෞරවයට ලක් වේ. මෙම පසුබිම තුළ උන් වහන්සේට වන්දනාමාන කිරීමේ වැදගත්කම සමාජ විද්‍යාත්මක වශයෙන් කවර ස්වරූපයක් ගන්නේ ද යන්න අවබෝධ කරගත යුතු ය. නාථ දෙවිඳුන් සිංහල දේව ධුරාවලියේ අංශ කිහිපයකින් සුවිශේෂී භාවයක් උසුලන දේව චරිතයකි. සිංහල බෞද්ධ සමාජය තුළ ලෞකික ඕනෑකම් වෙනුවෙන් වන්දනයට ලක් ව සිටින බොහෝ දෙවිවරුන් බැතිමතුන්ගේ සාධාරණ මෙන් ම අසාධාරණ ඉල්ලීම් වෙනුවෙන් ද සිය අණසක පාවිච්චි කරනු ඇතැයි යන විශ්වාසය ඇත. පුද්ගලයාගේ දියුණුව සහ අභිවෘද්ධිය මෙන් ම විනාශය ද පරිහානිය ද ඉටුකරගැනීමට මේ දේව චරිත අවස්ථානුකූල යොදාගනු දක්නට ලැබේ. එහෙත් නාථ දෙවිඳුන් මුළුමනින් ම පෙනී සිටිනුයේ යහපත් පරමාර්ථ වෙනුවෙන් පමණක් වීම සුවිශේෂී කරුණකි. අනෙක් අතට දේව ධුරාවලිය තුළ බුද්ධත්වයට සුදුසුකම් ලබා සිටින එක ම දෙවියන් වනුයේ ද නාථ දෙවියන් බව පැහැදිලි ය. බෝධිසත්වයෙකු ලෙසට අනුරාධපුර අගභාගයේ දී පටන් අවලෝකිතේශ්වර වන්දනය ප්‍රචලිත විය.

නාථ දෙවිඳුන්ගේ මෙම සුවිශේෂතා අපට සිංහල සමාජ සංවිධානයෙහි දැකිය හැකි යම් යම් ලක්ෂණ සමඟ සංසන්දනාත්මක ව තේරුම් ගත හැකි ය. මිනිසුන්ගේ ලෞකික හා ලෝකෝත්තර අපේක්ෂා අතර, සිදු වන සියුම් ගැටුම සමකාලීන සමාජය ඇසුරින් විවරණය කිරීමේ දී අපට පෙනීයන්නේ හැම පුද්ගලයෙකු ම මේ දෙයාකාර අපේක්ෂා ජන ජීවිතයේ දී ප්‍රාර්ථනය කරයි. තමන් ගත කරන ලෞකික ජීවිතයේ දී මුහුණ දීමට සිදු වන අනේක විධ ගැටලු, හිරිහැර කරදරවලින් මුළුමනින් ම විදීමට ඔවුන්ට නො හැකි ය. තමා මුහුණ පාන ප්‍රශ්නවලට හේතුව කිසිවකු විසින් තමා කෙරේ ඊර්ෂ්‍යාව නිසා කරනු ලබන සූනියමක ප්‍රතිඵලයෙකි යි යන විශ්වාසය බොහෝ දෙනා අතර ඇති බව ලංකාවේ දේව විශ්වාස පිළිබඳ ව කරනු ලැබූ බොහෝ සමාජ විද්‍යාත්මක පරීක්ෂණවල දී පැහැදිලි කර දී ඇත. මෙම විශ්වාසයෙහි දීර්ඝ කාලයක් පුරා පිහිටා සිටින අය ඒ සඳහා කාලී සහ සූනියම් වැනි දෙවිවරුන්ගෙන් පිහිට අයදිති. එසේ වුවත් ඔවුන්ට මේ අපලකාරී තත්වයන් ගෙන් මුළුමනින් ම හෝ දීර්ඝ කාලීන ව මිදීමට නො හැකි වේ. එහි ප්‍රතිඵලයක් ලෙස තව දුරටත් දරුණු දේව දඬුවම් අපේක්ෂා නො කරන ශාන්තිවාදී ආගමික ඇදැහීම් ඔස්සේ සහනශීලී මතයක් ලබාගැනීමේ පෙලඹීමක් මේ ජනතාව අතරින් දැකිය හැකි වේ. එහි දී යක්ෂයන් හා දරුණු භූතාත්මවලට වඩා ශාන්තිවාදී දේවතා බලවේගයක් පහදවා ගැනීමේ ප්‍රවණතාව වැඩියෙන් දක්නට ලැබේ. නාථ දෙවිඳුන් වැනි බෝධිසත්ව ගුණයෙන් අනූන වූ දේවතාවකු පිළිබඳ ආකල්ප වැඩි දියුණුවීමට මේ තත්වය බලපෑවේ යැයි සිතිය හැකි ය.

මෙසේ විනාශකාරී කටයුතුවල නොයෙදෙන ශාන්තිවාදී දෙවිවරුන්ට ද සාධාරණය කිරීම මගින් කාර්යන් කිහිපයක් ඉටු වේ. පළමු ව තමන් සතුරන් විනාශ කිරීමට මෙතෙක් කල් කරනු ලැබූ ක්‍රියා නිසා, තමා අකුසල් රැස් කළේ ය යන

හැඟීමෙන් මිදී සිත සනසා ගැනීමට හැකි වෙයි. දෙවනු ව නාථ දෙවියන් දේවත්වය ඉක්ම වූ මතු බුදුවන බෝධිසත්වයෙකු වීම මගින් තමා දේව ධුරාවලියේ විශිෂ්ටතම අග්‍රගණ්‍ය චරිතය දිනා ගත්තේ ය යන සහනශීලී හැඟීම ඇතිවීම යි. තුන්වෙනුව නාථ දෙවිඳුන්ගේ මූලස්ථානය පිහිටා ඇති සෙංකඩගල දළදා සමිඳුන් වැඩ සිටින සුවිශේෂී ස්ථානය වීම නිසා, දෙවිවරුන්ගේ පසුබිම හුදකලා නො කර බෞද්ධ පූජනීය ස්ථානවලට අනුකූල ව තමා බෞද්ධ වාසස්ථානයක වෙසෙන්නේ ය, යන හැඟීම බෞද්ධයන්ගේ සිතට ඇතුළු කරගැනීමට මෙ මගින් ඉඩ ලැබේ. බුදුන්ගෙන් හෝ දළදා වහන්සේගෙන් තම ලෞකික ප්‍රශ්නවලට විසඳුම් ලබාගත නො හැකි ය. එහෙත් හින්දු දේවතා, යක්ෂ සහ භූතාදීන් වෙත යාම ද කළ නො හැකි ය. තම ගැටලු වෙනුවෙන් පෙනී සිටීමට බෞද්ධ පසුබිම තුළත් නව දේවතා බලයක් උත්පාදනය කරගත යුතු ය. ඒ සඳහා වඩාත් උච්චතම චරිතය වන්නේ බෝධිසත්වයෙකු වූ නාථ දෙවිඳුන් ය.

නාථ දෙවිඳුන් සම්බන්ධ දේවාලය උඩරටට පමණක් බොහෝ දුරට සීමාවීම ද මේ සමඟ සාකච්ඡා කළ යුතු තවත් කරුණකි. සූනියම් දේවතාවා ඇදහීම නාගරික සමාජයේ බහුල ලෙස ව්‍යාප්ත වීම තුළ එම නාගරික ජනයා මිරිකී සිටින ගැටලු, ප්‍රශ්න හා අභියෝග හඳුනාගත හැකි ය. කතරගම හා විෂ්ණු පොදුවේ හැම තැන ම වන්දනයට ලක් වෙන බව පෙනීයයි. එහෙත් නාථ දෙවිඳුන් වැඩ සිටින්නේ දළදා වහන්සේ වැඩ සිටින සෙංකඩගල නුවර ය. ඉන් පරිබාහිර ප්‍රධාන නාථ දේවාලයක් ගැන තොරතුරු දක්නට නො ලැබේ. දළදා මාළිගාව හා බැඳුණු චාරිත්‍ර කිහිපයක් ද නාථ දේවාල චාරිත්‍ර අතර තිබීම ද මේ සමඟ ම හඳුනාගත හැකි ය. මේ අවියෝජනීය සම්බන්ධතාව කියා පාන්නේ පැහැදිලි අදහසකි. එනම්, නාථ දෙවිඳුන් පැහැදිලි ව ම බුදුන් වහන්සේ හා බුදු දහම සංකේතවත් කරන "දේව ගණයක්" නිරූපණය කරන බව යි.

දෙවි කෙනෙකුගේ ජනප්‍රියභාවය වර්ධනය වීම අවසාන වන්නේ එම දෙවියන්ගෙන් අපේක්ෂා කරන කාර්ය සාධනය නිෂ්ප්‍රභ වීමෙන් බව බොහෝ සමාජ විද්‍යාඥයෝ පෙන්වාදී දෙති. දෙවි කෙනෙකු වෙත ගොස් ලෞකික අපෙක්ෂා ඉටු කරවා ගැනීමෙහි දී එම දෙවියන්ගේ බලපරාක්‍රමය භාවිතයට ගනු ලැබේ. සිය කාර්ය ඉටු වීමෙන් පසු ව බැතිමත්හු දෙවියන්ට පින් පමුණුවති. එම දෙවියන් ජනප්‍රිය වීම නිසා වඩ වඩාත් බැතිමතුන් පිහිට පැතීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු වීමෙන් උන් වහන්සේට පින් ලැබීමත් සිදු වේ. මෙහි ප්‍රතිඵලය ඔස්සේ දෙවියන් වඩවඩාත් ශක්තිමත් වී ලෝකෝත්තර පරමාර්ථ කෙරේ නැඹුරු වේ. අවසානයේ දෙවියෝ බෝධිසත්ව බවට පත් වෙති. එ විට එම දෙවිඳුන් පෙනී සිටින්නේ දැහැමි ඉල්ලීම් වෙනුවෙන් වුවත් අනුන්ට කරදර කිරීමට හෝ විනාශ කිරීමට උන් වහන්සේ ඉදිරිපත් නො වෙති. මෙය එක්තරා දුරකට දෙවිඳුන්ගේ අසීමිත බලමහිමය ලඝු වීමකි. එහෙත් මෙම ලඝුවීම වැදගත් වන්නේ උන් වහන්සේ ඒ නිසා ම බෝධිසත්ව ගුණයකින් පිදුම් ලබා ඇති බැවිනි. නාථ හෙවත් අවලෝකිතේශ්වර නාථ බෝධිසත්වයන් මේ මට්ටමට ළඟා වූ එක ම දෙවිඳුන් වීම සුවිශේෂී කරුණකි.

## නිගමනය

මෙතෙක් අවධානයට යොමු වූ කරුණුවලින් පැහැදිලි වන්නේ නාථ දේව වන්දනය ක්‍රමික විකාශනයක ප්‍රතිඵලයක් බව යි. මිනිසුන් හට ආශිර්වාද කර සෙත සලසා අවශ්‍ය ආශිර්වාදය සලසා දුන්නත්, නාථ දේව වන්දනය දියුණුවීමක් දක්නට නො ලැබීම ද කැපී පෙනෙන කරුණකි. එසේ වන්නේ ඇයි ද යන්න සොයා බැලීමේ දී අවබෝධ වූ කරුණු කිහිපයකි. පුද්ගල ජීවිතයේ ඇති වන යම් යම් සිදුවීම්වල ලෞකික පිහිට නාථ දෙවියන්ගෙන් ලැබුණත් කිසිදු අවස්ථාවක මිනිසාගේ භෞතික සංවර්ධනයට හේතු නො වන බව වටහාගෙන ඇත. එ බැවින් නාථ දෙවියන් කරා යනවාට වඩා කතරගම, ගැටබරුව, මුන්නේශ්වරම් යැම වඩාත් යෝග්‍ය බව බැතිමතුන් තුළ විශ්වාසයක් පවතී. නූතන සමාජ චල්‍යතාව තුළ නාථ වන්දනය ක්‍රමයෙන් අඩුවීයාමක් දක්නට ලැබේ. එහෙත් උන් වහන්සේ බෝධිසත්වයෙකු ලෙස උන් වහන්සේ බෞද්ධයන්ගේ නිබඳ ගෞරවයට ලක් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


**ඌන පූරණ සහිතො මහාවංසය, (1929)** සංස්. පොල්වත්තේ බුද්ධදත්ත, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

**පූජාවලිය**, (1986) සංස්. කිරිඇල්ලේ ඤාණවිමල, ගුණසේන සහ සමාගම, කොළඹ:

**නිකාය සංග්‍රහය**, (1907) සංස්. සීමොන් ද සිල්වා, මෙන්ඩිස් ගුණසේකර සහ ඩබ්ලියු. එෆ්.ගුණවර්ධන, රජයේ මුද්‍රණාලය, කොළඹ:

**තිසර සංදේශය** (1936)සංස්. කුමාරතුංග මුනිදාස, සූරිය මුද්‍රණ, කොළඹ:

**සද්ධර්මාලංකාරය, (1953)** සංස්. කලුතර සෝමානන්ද, රත්නාලංකාර ප්‍රකාශකයෝ, කොළඹ:

අබයරත්න, ඒ.එච්.එම්. **ගම්පොළ යුගය**, (2006) ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ:

ඉලංගසිංහ, මංගල, **මධ්‍යකාලීන ලංකාවේ ආගම**, (2005) එස්. ගොඩගේ සහ සමාගම, කොළඹ:

ගයිගර්, විල්හෙල්ම්, **මධ්‍ය කාලීන ලංකා සංස්කෘතිය**,(1969) පරි. ඇම්. බී. ආරියපාල, ඇම් ඩී ගුණසේන සහ සමාගම, කොළඹ.

ජයතිලක ඩී. බී. **කතිකාවත් සඟරා**,(1963) විද්‍යාලංකාර යන්ත්‍රාලය, කැලණිය.

ධීරානන්ද, කහටපිටියේ, **ගම්පොළ යුගය**,(1965) ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

පියනන්ද, අටබාගේ, **ගම්පොල යුගයේ මූර්ති ශිල්පය**,(1993) මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

තිලකසිරි, සිරි, **සිංහල සංදේශ කාව්‍යයේ සමාජ පසුබිම**,(2008) එස්. ගොඩගේ සහ සමාගම, කොළඹ.

සීලවිමල, බෝගොඩ, **බෞද්ධ ප්‍රතිමාඝරයට පිවිසි හින්දු දෙවියෝ**,(2006) ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

චන්ද්‍රසිරි, ලියනගේ, **ලක්දිව අභිෂේක මංගල්‍යය**,(2006) එස්. ගොඩගේ සහ සමාගම, කොළඹ.

වික්‍රමගමගේ, චන්ද්‍රා, වික්‍රමගේ, චන්ද්‍ර, **ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා කලාව**,(2006) එස්. ගොඩගේ සහ සමාගම, කොළඹ.

හෝල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, **මකුට මුනිධාරි අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය**,(1994) පරි.පී.බී. මීගස්කුඹුර, ප්‍රදීප ප්‍රකාශන, කොළඹ.

හෙට්ටිආරච්චි ඩී. ඊ. "නිරිත රාජධානි සමයේ සාහිත්‍යය සහ කලාව", **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා**

**ඉතිහාසය** 11,(1972) සංස්. නිකලස් ආටිගල සහ වෙනත් අය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලය, කැලණිය.

**EZ(1948).** Ed.Senerat Paranavitana, Oxford University Press, London.

Silaskandha, Mahasthavira, C.A. (1926) Ed.**Vrttaratnakara-Pancika**, Nirnnyasagar Press, Bombay.

Mudiyanse, Nandesena(1976) **The Art and Archietecture of the Gampola Period**, Gunsena, Colombo.

Paranavitana, S.(1951) **"Bodhisattva Avlokitesvara in Ceylon" B.C.Vol**.Part,2,Ed. D.R.Bhandikar,Baroda Oriental Research Iìstitute.

Paranavitana, S.(1966) **"Lankatilaka Inscription"**, **University of Ceylon Review**.

Paranavitana, S.(1966) **"Mahayanism in Ceylon" Ceylon Journal of Science**.